CAMERON PALE & MEDINA PRIVATE LIMITED

**ව්‍යාපාරික පුවත් නිවේදනය**

# මරුටි සුසුකි පෙට්‍රල් ලීටරයකට කිලෝ මීටර 20.7 ක් රජ ගමනේ...

***<u>උපරිම ඉන්ධන පිරිමැස්මක් ඇති මරුටි සුසුකි AMW ඉකොනොමි චැලෙන්ජ් රැළි 2007 හි දී එය ඔප්පු කරයි</u>***

ඇසෝසියේටඩ් මෝටර්වේස් පී එල් සී ( AMW ) සමාගම ශ්‍රී ලංකාවට නවීනතම බ්‍රැන්ඩ් නිව් මෝටර් රථ ගෙන්වා බෙදා හරින ප්‍රමුඛතම සමාගම වේ. වසර ගණනාවක් පුරා මෙරට වාහන මිලදී ගන්නන් ගේ අසීමිත විශ්වාසය දිනා ගනිමින් වාහන අලෙවියේ යෙදී සිටින AMW සමාගම විසින් දේශීය රියදුරන් වෙත මරුටි සුසුකි වාහන වල ඉන්ධන කාර්යක්ෂමතාව පිළිබඳව පොදු ජනතාවටත් මරුටි සුසුකි මිලදී ගැනීම සඳහා පෙරමග බලා සිටින අනාගත ගැනුම්කරුවන් වෙනුවෙනුත් සුසුකි මරුටි මාදිලියේ මෝටර් රථ සහභාගී කොටගෙන මෝටර් ස්පෝර්ට්ස් සමාජය ( C M S C ) හා එක්ව AMW ඉකොනොමි චැලෙන්ජ් 2007 නමින් වාහන රැළි තරගයක් සංවිධානය කරනු ලැබීය. 2007 සැප්තැම්බර් මස 30 වැනි දින සුසුකි මරුටි වැඩපල පරිශ්‍රයෙන් ආරම්භ කර ශ්‍රී ජයවර්ධනපුර පාර ඔස්සේ නාවල, තලවතුගොඩ, හෝකන්දර, හංවැල්ල යන නගර පසු කරමින් , හබරකඩ, ගෝනපොල, කහතුඩුව, පිලියන්දල, බොරලැස්ගමුව, රාගිරිය ඔස්සේ නැවත සුසුකි මරුටි සේවා මධ්‍යස්ථානය අසලින් අවසන් වූ මෙම රැළිය කිලෝමීටර 100ක දුරක් විවිධ මාර්ග හා ගමනාගමන තත්ත්වයන් ඔස්සේ තෝරාගත් මරුටි සුසුකි මෝටර් රථ ගමන් කරවූ අතර ඉන් අඩුම ඉන්ධන දහනයකින් තම ඉලක්කය දක්වා ගමන් ගත් ජයග්‍රාහකයින්ට සුවිශේෂ ත්‍යාගයන් රැසක් පිරිනැමීමට කටයුතු කරනු ලැබීය.

මේ සඳහා විවිධ වයස් කාණ්ඩයන් හී පසුවන තරුණ මහළු මරුටි සුසුකි හිමිකරුවන් රැසක් කිසිදු වයස් හෝ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව උද්‍යෝගිමත්ව සහභාගි වූ අයුරු දක්නට ලැබුණි. මෙය නැරඹීම සඳහාත් විශාල ජනතාවත් මග දෙපසට එක්වී සිටිය අතර රැළිය සඳහා සහභාගීවීම පිණිස ඒ එම් ඩබ්ලිව් සේවා නිලධාරීන් විසින් තෝරා ගනු ලැබූ නියමිත ආකාරයෙන් සකසනු ලැබූ සුසුකි වාහන 40 ක් සංවිධායකයින් විසින් පැනවූ නීති රීති හා කොන්දේසි මත එක පෙලට ගමන් කරනු දැකීමත්, අඩුම ඉන්ධන දහනයකින් යුතුව ඉදිරියට ඇදෙන්නට ගන්නාවූ විවිධ ක්‍රියාමාර්ගයන් ද සැබවින්ම වාහන ලෝලීන්ට දැඩි ප්‍රීතියට කරුණක් විය. මෙම ගමනේ දී පොදු ජනතාවටත් වාහන භාවිතා කරන්නන්ටත් ලබා දුන් මූලිකම පණිවුඩය වූයේ ' අඩුම ඉන්ධන වියදමකින් උපරිම දුරක් යන ලංකාවේ කාටත් ඔබින වාහනය මරුටි සුසුකි ' බව ක්‍රියාවෙන්ම ඔප්පු කර පෙන්වීමයි.

මෙම රැළිය සම්පූර්ණයෙන්ම සංවිධානය කරනු ලැබුවේ හා විනිශ්චය කරනු ලැබුවේ වර්තමානයේ දී ලංකාවේ පැරණිතම මෝටර් රථ සමාජය වන සිලෝන් මෝටර් ස්පෝර්ට්ස් සමාජය ( C M S C ) විසින් වූ අතර අදාල තරග නීති රීති සහභාගිවන්නන්ට ලබා දෙමින් එමෙන්ම ධාවනයේදී අනුගමනය කළ හැකි විවිධ ක්‍රමෝපායන් පිළිබඳ දැනුවත් කරමින් එම සමාජයේ නිලධාරීන් විසින් මේ සඳහා විශාල දායකත්වයක් සපයනු ලැබීය. මෙම රැළිය සඳහා සහභාගී වූ වාහන සඳහා ගමන් කිරීම සඳහා ලබා දුන් මාර්ග සැලැස්ම සකස් කිරීමට ඔවුන් කටයුතු කරනු ලැබුවේ එදිනෙදා වාහනයක ගමන් කිරීමේදී රියදුරන් විසින් මුහුණ දෙන්නාවූ පොදු දුෂ්කරතාවයන් පදනම් කොටගෙනය. ඉරිදා දිනයක් වූ හෙයින් වාහන තදබදයන්, වේග සීමා පාලනයන් හා නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයයේ කඳු හෙල්, තැනිතලා, පල්ලම්, අබලන් මාර්ග හා සංවර්ධිත මහා මාර්ග යන සියල්ල ආවරණය වන සේ මෙම වාහන ගමන් කරවීමට සහභාගීවන්නන්ට සිදු විය. මෙහි අනෙක් සුවිශේෂ වූ කරුණ වූයේ අදාල මාර්ගය පිළිබඳ සහභාගීවන්නන් දැනුවත් කරන ලද්දේ තරග ආරම්භයට විනාඩි 30 කට පෙර වීමයි. එම නිසා කිසිදු පෙරහුරුවකට හෝ අතුරු මාර්ගයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඔවුන්ට අවකාශ නොවීය. විනිශ්චය මධ්‍යස්ථානයන් 10ක් අදාල මාර්ගයේ ස්ථාපිත කර තිබූ අතර සහභාගීවන්නන් එම මධ්‍යස්ථානයන් ගේ නිරන්තර අවධානයට හා අධීක්ෂණයට ලක්විය.

' ශ්‍රී ලංකාවේ මෝටර් වාහන රැළි සංවිධානයේ අති මහත් පළපුරුද්දක් ඇති සිලෝන් මෝටර් ස්පෝර්ට්ස් සමාජය ( C M S C ) මේ වෙනුවෙන් මනා කැපවීමක් සිදු කරනු ලැබුවා, විශේෂයෙන්ම මෙම රැළිය ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම මෝටර් රථය බවට පත්ව ඇති මරුටි සුසුකි මාදිලියේ තෝරාගත් වාහන සඳහාම වෙන්වූ මෙම රැළිය ශ්‍රී ලංකාවේ වාහන භාවිතාකරුවන්ගේ නෙත්

නව මානයකට කරනු ලැබූ බව අපට ලැබුණු ප්‍රතිචාරයන්ගෙන් වඩාත් තහවුරු වෙනවා. ලංකාවේ දිනෙන් දින ඉහළ යන ඉන්ධන මිලට විසඳුමක් ලෙසින් අතිශය සුවිශේෂ ඉන්ධන කාර්යක්ෂමතාවයකින් යුක්ත මෙම වාහන පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට අත්දැකීමෙන්ම මෙහි ඉන්ධන පිරිමැස්ම වටහා ගැනීමට AMW ඉකොනොමි රැළි 2007 විශාල උපකාරයක් වුණා. ඒ නිසා මම ඒ වෙනුවෙන් වෙහෙසුණු සෑම කෙනෙකුටමත් සහභාගීත්වය තුළින් අප කෙරෙහි විශ්වාසය තැබූ වටිනා මරුටි සුසුකි පාරිභෝගිකයින්ටත් මාගේ ස්තුතිය පිරිනමනවා 'යැයි AMW සමාගමේ සුසකි - මරුටි වෙළෙඳ කළමණාකරු විරාන් ද සොයිසා මහතා පවසා සිටියේය.

සුසුකි මරුටි 800 හා ඇල්ටෝ හිමිකරුවන් මේ සඳහා ලියාපදිංචි වූ අතර රැළිය පවත්වන්නට සතියකට පෙර සංවිධායක මණ්ඩලයේ නිලධාරීන් හා ධාවන තරඟ විශේෂඥයින් විසින් මෙහිදී අනුගමනය කළ යුතු නීති රීති හා උපදේශයන් පිළිබඳව සහභාගීවන්නන් සඳහා ආරක්ෂාකාරීව , මනා ඉන්ධන කළමනාකාරීත්වයකින් යුක්තව තම රථය ධාවනයේ යොදවන අයුරු පිළිබඳව පැහැදිළි අවබෝධයක් ලබා දෙනු ලැබීය.

මෙම සුවිශේෂ රැළිය සඳහා සහභාගීවන්නාවූ සියළුම ධාවකයන් තම රථ රැළියට පෙර දින රාජගිරියේ පිහිටි AMW සේවා මධ්‍යස්ථානය වෙත භාර දුන් අතර එහි නිලධාරීන් විසින් මෝටර් රථයේ තත්ත්වය පිළිබඳව පරීක්‍ෂා කොට ඉන්ධන වැයවීම පිරික්සා බලා ඉන්ධන පරිමාව නිසි ප්‍රමාණයන්ට සකසා මුද්‍රා තබනු ලැබීය. මෙම සියලු තත්ත්වයන් හා බලධාරීන් විසින් ලබා දුන් රිය පැදවීමේ කොන්දේසි යටතේ තෝරාගත් වාහන 40 සමස්ත ප්‍රතිශතයක් වශයෙන් පෙට්‍රල් ලීටරයකට කිලෝ මීටර 20.7 ක් ධාවනය කළ අතර මෙහි ප්‍රථම ස්ථානය දිනා ගනු ලැබුවේ තරඟකරු අංක 39 ඔස්සේ තරඟ වැදුණු J.N.S.K. ද මෙල් මහතා වන අතර දෙවන ස්ථානය තරඟකරු අංක 33 ඔස්සේ තරඟ වැදුණු H.L.A.U. සංජීව මහතා ද තෙවන ස්ථානය S.G.S. සමරවීර මහතා විසින් ද හිමි කරගන්නා ලදි. ප්‍රථම ස්ථානය සඳහා ත්‍යාග වශයෙන් රුපියල් 60,000ක් ද දෙවන ස්ථානය සඳහා රුපියල් 40,000ක් ද තෙවෙනි ස්ථානයට රුපියල් 20,000ක් ද පිරිනැමීමට AMW සමාගම කටයුතු කළ අතර සහභාගී වූ සෑම දෙනාටම වටිනා සහතිකපතක් හා නොමිලේ රුපියල් 1000ක් සේවා වාර වවුචරයක් හිමි විය. මෙහි තවත් විශේෂත්වයක් වූයේ මෙම රැළිය සඳහා එක්වූ ඇල්ටෝ රථයන්ගෙන් තරඟයට එක්වූ කාන්තා තරඟකාරියන් අතරින් සෂෙණුකා සපරමාදු ප්‍රමුඛ කාන්තා කණ්ඩායම 8 වැනි ස්ථානය හිමි කර ගනිමින් පළමු ජයග්‍රාහකයින් 10 දෙනා අතරට පැමිනීමත් , මිශ්‍ර කණ්ඩායමක් ලෙසින් තරඟ වැදි රුක්ෂානි දාබරෙ හා සහායකයා 10 වන ස්ථානය හිමිකර ගැනීමට සමත් වීමයි.

' මෙවන් ඉන්ධන පිරිමැසුම් රැළි ලෝකයේ අනෙක් රටවල විශාල ජනප්‍රියත්වයක් උසුලන අතර ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට පැවැත්වූ මෙම රැළිය සැබවින්ම මෝටර් රථ රැළි ඉතිහාසයේ නවතම පිටුවක් පෙරළන්නටත් සුපිරි ඉන්ධන පිරිමැස්මක අභියෝගය ජයගන්නා අයුරු ඇස් පනා පිට දැක ගන්නටත් දායක විය. මෙතැන් පටන් සෑම වර්ෂයකම ඉන්ධන අරපිරිමැස්ම හා , කාර්‍යක්‍ෂම රිය ධාවනය පිළිබඳව සජීවී උදාහරණයන් ගෙනෙන මෙවන් රැළි පවත්වන්නට අප ඉතාම කැමැත්තෙන් සිටිනවා ' යැයි සිලෝන් මෝටර් ස්පෝර්ට්ස් සමාජයේ ( C M S C ) ගරු සභාපති බන්දුල වීරසිංහ මහතා පවසා සිටියේය.

ඇසෝසියේටඩ් මෝටර්වේස් පී එල් සී ( AMW ) සමාගම විසින් වර්තමානයේ රජයට විශාල ගැටළුවක් වී ඇති ඉන්ධන මිල සම්බන්ධ ප්‍රශ්නයට පිළිතුරක් සපයමින් මහජනතාවගේ ඉන්ධන වියදම් බර සැහැල්ලු කිරීමට නිසි මග පෙන්වා දෙමින් සුපිරි ඉන්ධන ක්‍රියාකාරීත්වයකින් යුක්ත මෝටර් රථ හා එහි කාර්යක්‍ෂමතාවයන් පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීම පිණිස මෙම රැළිය පවත්වන ලදි.